ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය

කාර්යස්ථ පුහුණුවීම සඳහා උපදෙස් මාලාව

පුහුණුව ආරම්භ වන අවස්ථාවේදී සම්පූර්ණ කලයුතු ලේඛණ

පුහුණු කිරීමේ ගිවිසුම

පුහුණුවන්නා, සේවායෝජකයා හා සාක්ෂිකරුවන් විසින් පුහුණුවීමේ ගිවිසුම පිටපත් තුනකින් අත්සන් කලයුතු වේ. සියලුම පිටපත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය වෙත ලියාපදිංචිය සඳහා පුහුණුවට වාර්තා කර දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතුය.

වැඩබිම් පෝරමය

පුහුණුව ලබන්නා විසින් වැඩබිම් පෝරමය නිසි පරිදි පුරවා අත්සන් තැබිය යුතුය. පසුව එම පෝරමය ඔබ විසින් සම්පූර්ණ කරන ලද ගිවිසුම් පිටපත් **03** සමග අමුණා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය වෙත එවිය යුතුය.

ගිවිසුම අලුත් කිරීම

පුහුණුව ලබන්නා වෙනත් ආයතනයකට පුහුණුව සඳහා යොමු වන්නේ නම් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ගිවිසුම අලුත් කිරීමේ පෝරමයක් පිටපත් තුනකින් යුක්තව අදාල සම්බන්ධිත ලිපිනයට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. පළමු සේවා යෝජකයා, දෙවන සේවා යෝජකයා හා පුහුණුව ලබන්නා සහ සාක්ෂිකරුවන් දෙදෙනෙකු එම පිටපත් තුනකින් අත්සන් කල යුතුය.

පුහුණුව සටහන් කර තැබීම

ප්‍රගති සටහන – දෛනික වාර්තා පොත

සියලුම පුහුණුවන්නන් දෛනික වාර්තා පොත පවත්වාගෙන යා යුතුය. සෑම සති අන්තයකම පුහුණු ප්‍රගතිය සටහන් කර පුහුණුකිරීමේ නිලධාරි තැනගේ /ඉංජිනේරු තැනගේ නිර්දේශය හා සහතික කිරීමට ඉදිරිපත් කල යුතුය. **(දෛනික වාර්තා පොත රාජගිරියේ පිහිටි ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පුහුණු අංශයෙන් (කාර්යස්ථ පුහුණු) රුපියල් 300/-ක මුදලක් ගෙවා මිලදී ගත හැකි අතර,ලියාපදිංචි ගාස්තුව රුපි. 750/=කි. එම මුදල Collection Account, Peoples Bank, Nugegoda යන බැංකු ශාඛාවට National Apprentice & Industrial Training Authority යන නමට 1741001703477379 අංකයට බැරකර රිසිටි පතෙහි පිටපතක් ඔබලඟ තබාගෙන මුල් පිටපත ගිවිසුම සමඟ අමුණා අප අධිකාරියට එවිය යුතුය.)** මෙම දෛනික වාර්තාපොත පුහුණුවන්නා විසින් අධික්ෂණ නිලධාරීන්, පරික්ෂකවරුන් ගේ උපදෙස් හා පුහුණු ප්‍රගතිය සටහන් කිරීම සඳහා නිරතුරුවම තමන් සන්තකයේ තබාගත යුතුවේ.

පුහුණුවීමේදී හැසිරීම

පුහුණුව ලැබීමේ කාලය තුල යහපැවැත්ම විනය පවත්වා ගැනීම

පුහුණුව අවසානයේ සහතිකය ලබාගැනීමේ අනිවාර්යය අවශ්‍යතාවයක් හැටියට පුහුණුවන්නාගේ යහපත් කල් ක්‍රියාව හා විනයගරුක බව විශේෂයෙන් අපේක්ෂා කෙරේ. පුහුණුවීමේ ගිවිසුම් ප්‍රකාර පුහුනුවන්නා ආයතනයේ ඇති නිති රිති වලට යටත්වේ. සේවා යෝජකයාට ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ කාර්යස්ථ පුහුණු අංශයෙන් ලබාගන්නා උපදෙස් මත පුහුණුවන්නාගේ මනා හැසිරීම හා කල්ක්‍රියාව ආරක්ෂා කරගැනීමට ඕනෑම පියවරක් ගතහැක.

නිවාඩු ලබාගැනීමේ පටිපාටිය

සෑම මසකටම අනියම් නිවාඩු දින 1/2 හා දින එකක වෛද්‍ය නිවාඩු ලබාගැනීමට හිමිකම් තිබේ. එසේ වුවද විශේෂ කාරණා අරභයා අනුමත නිවාඩු පදනමක් මත කාල සීමාවක් සඳහා පුහුණුවන්නාට නිවාඩු ලබාගත හැක. ආයතනයේ පුහුණු කිරීම් අධික්ෂණ නිලධාරිගේ පූර්ව අනුමැතියකින් තොරව නිවාඩු ලබා ගැනීම සඳහා අවසර නොලැබේ.

අ:පි:ඛ:

නවාතැන් පහසුව

නවාතැන් පහසුකම් සපයා ගැනීමේ වගකීම මුළුමනින්ම ආධුනිකයා සතුවේ . කෙසේ වෙතත් සේවා යෝජකයා මේ සම්බන්ධයෙන් සහයෝගය දක්වන්නේ නම් එය බෙහෙවින් අගය කෙරේ.

සැලකිල්ලට බඳුන් විය යුතු වෙනත් කරුණු

පුහුණුව ආරම්භයේදී දැනුම් දුන් පරිදි පිළිගත හැකි සාධාරණ හේතුවක් ඉදිරිපත් නොකොට පුහුණුවට වාර්තා නොකරන්නේ නම් ඔහු පුහුණුව නොසලකා හැරි අයකු සේ සැලකේ.

සාධාරණ කාල සීමාවකට පසුව එවැන්නකුගේ නම ලියාපදිංචි ලේඛණයෙන් ඉවත් කිරීමට පියවර ගනුඇත.

- පුහුණුවන්නා විසින් පුහුණු කිරීමේ ගිවිසුම අත්සන් කර, අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම්, පුහුණුවීම් ඇගයීම් කටයුතු සඳහා පුහුණුව ලබන ආයතනය පිළිබඳව දැනුම් දියයුතුය.
- අදාළ ආයතනයන්ට අවශ්‍ය දැනුම් දීම හා ක්‍රියා කිරීමට දැනටමත් යොමු කර ඇති බැවින් වරක් තීරණය කළ පසු පුහුණුවන ආයතනය වෙනස් කරවා ගැනීම , සුහද මාරු ලබාගැනීමේ ඉඩකඩ නොමැත.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංක 0112888782 -5 වේ.
- ශ්‍රම බලකායේ කොටසක් හැටියට ආධුනිකයන් සැලකෙන බැවින් ආයතනය තුල බලපැවැත්වෙන නීතිරෙගුලාසි වලට යටත්ව මනා සංවරයකින් හැසිරිය යුතුය.
- සියලු විමසීම් හා සංනිවේදනයන් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ කාර්යස්ථ පුහුණු අංශයට ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව පුහුණු කාල සිමාව ආධුනිකයාට දීර්ඝ කරගත නොහැක. එසේ වුවහොත් පුහුණුව නොලැබූ අයෙකු ලෙස සැලකේ.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය පුහුණුකාල සීමාව තුල නිවාඩු ලබාගැනීම අනුමත නොකරන අතර එවැන්නක් අනුමත කලහොත් ආධුනිකයාගේ පුහුණුවන කාලසීමාව දීර්ඝ කිරීම තීරණය කරනු ඇත.
- පුහුණුවන කාල සිමාව තුල ආධුනිකයන් සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය මගින් කිසිම ගෙවීමක් කරනු නොලැබේ.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය ආධුනිකයන් සඳහා පුහුණුව සැපයීමට සහය වන්නේ විනය ගරුකව මනා හැසිරීමකින් යුතුව පුහුණුව ලබන ආයතනයේ සිටින තාක් කල් පමණි. නොමනා හැසිරීම සමබන්ධයෙන් කිසියම් ආයතනයක් පුහුණුව ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරියද එම ආධුනිකයාට තවදුරටත් පුහුණුව ලබාදීමේ කටයුතු නොකරනු ඇත.

නයිටා ප්‍රධාන කාර්යාලය සමඟ සංනිවේදනය

සහකාර අධ්‍යක්ෂ (කාර්යස්ථ පුහුණු)

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය

971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,

වැලිකඩ –රාජගිරිය

දිස්තික් කාර්යාලය සමඟ සංනිවේදනය